සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

10946

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade : 6 ශ්‍රේණිය

විද්‍යාව

කාලය / நேரம் / Time : පැය 2 යි

නම / பெயர் / Name ..................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

**I කොටස**

**වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. සියලුම ජීවීන්ට පොදු ලක්ෂණයක් නොවන්නේ,
 (1) ප්‍රජනනය (2) වර්ධනය (3) ශ්වසනය (4) ප්‍රභාසංස්ලේෂණය

02. ජලයේ සිටින ක්ෂුද්‍ර ජීවීන් පැහැදිලිව නිරීක්ෂණයට වඩාත් සුදුසු උපකරණය කුමක් ද?
 (1) දුරේක්ෂය (2) සංයුක්ත අණ්වීක්ෂය (3) අත්කාචය (4) ඉහත සියල්ලම

03. එක් ආහාර වර්ගයක් මත පමණක් යැපීම නිසා වඳවී යාමේ තර්ජනයට මුහුණපා සිටින සත්වයෙකි.
 (1) චීටා (2) පීරාඡ් (3) පැන්ඩා (4) දිවියා

04. වඩාත් කාර්යක්ෂම විදුලි බුබුළු වර්ගය මින් කුමක් ද?
 (1) සූත්‍රිකා බල්බ (2) ප්‍රතිදීප්ත පහන් (3) CFL බල්බ (4) LED බල්බ

05. ළඳරු සූප්පු, අත් ආවරණ සෑදීමට රබර් යොදා ගනී. ඊට හේතු වන්නේ රබර් සතු කවර ගුණය ද?
 (1) භංගුරතාවය (2) ප්‍රත්‍යාස්ථ ගුණය (3) ආඝාත්‍ය ගුණය (4) මෘදු බව


06. පෘථිවියේ පවතින පරිභෝජනයට ගත හැකි ජලය ප්‍රතිශතය
 (1). 1% පමණි. (2). 10% පමණි. (3). 0.01% පමණි. (4). 0.1% පමණි.

07. උෂ්ණත්වය මැනීමේ අන්තර් ජාතික **සම්මත ඒකකය,**
 (1) $^{o}C$ (2) K (3) $^{0}F$ (4) J

08. අසත්‍ය ප්‍රකාශය තෝරන්න,
 (1) ආහාර දාම කිහිපයක් එකිනෙක සම්බන්ධ වීමෙන් ආහාර ජාලයක් ගොඩ නැගී ඇත.
 (2) ආහාර දාමයක පළමු පුරුක නිෂ්පාදකයා ලෙස හඳුන්වයි.
 (3) ආහාර දාමයක දෙවන පුරුක අනිවාර්යයෙන්ම ශාක භක්ෂකයෙකි.
 (4) ආහාර දාමයක තුන්වන පුරුක මාංශ හෝ සර්ව භක්ෂකයෙක් විය හැකිය.

09. පරිසර උෂ්ණත්වයට අනුව ශරීර උෂ්ණත්වය වෙනස් කර නොගන්නා සත්වයා වන්නේ,
 (1) මිනිසා (2) පිඹුරා (3) ගෙම්බා (4) කටුස්සා

10. රූපයේ දැක්වෙන මිනුම් සරාවේ අඩංගු ද්‍රව පරිමාව වඩාත් නිවැරදිව වන්නේ,




(1) 26 ml (2) 25 ml
(3) 20 ml (4) 30 ml

11. චුම්භක සතුවන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

(A) චුම්භකය පුරාම ඒකාකාරව චුම්භක ගුණ පැතිරී ඇත.
(B) චුම්බකයේ ධ්‍රැව දෙකෙහි චුම්භක ගුණ වැඩිපුර ඇත.
(C) විජාතිය චුම්බක ධ්‍රැව ආකර්ශනය කරයි.

මින් සත්‍ය වන්නේ,

(1) A පමණක් සත්‍ය වේ. (2) B පමණක් සත්‍ය වේ.
(3) B හා C සත්‍ය වේ. (4) A.B හා C සියල්ල සත්‍ය වේ.

12. තමා විසින් ම ආලෝකය නිකුත් කරන වස්තු හැඳින්වෙන්නේ

(1) දීප්ත වස්තු ලෙසය. (2) අදීප්ත වස්තු ලෙසය.
(3) ආලෝක ප්‍රභව ලෙසය. (4) පාරදෘශ්‍ය වස්තු ලෙසය.


13. නොරොච්චෝලේ පිහිටා ඇති විදුලි බලාගාරය ක්‍රියාත්මක කිරීමට ශක්තිය ලබා ගන්නේ පහත කුමන ක්‍රමයෙන් ද?

(1) ගලායන ජලයේ ශක්තිය (2) ඩීසල් (3) ගල් අඟුරු (4) සූර්ය ශක්තිය

14. කාලගුණ වාර්තාවක 12.5mm ලෙස දක්වා ඇත්තේ,

(1) උෂ්ණත්වය (2) ආර්ද්‍රතාවය (3) සුළඟේ වේගය (4) වර්ෂාපතනය

15. මෙම සම්මත සංකේතයෙන් දැක්වෙන්නේ,



(1) ස්ථිර ප්‍රතිරෝධකයකි.
(2) විචල්‍ය ප්‍රතිරෝධකයකි.
(3) ආලෝක සංවේදක ප්‍රතිරෝධකයකි.
(4) ආලෝක විමෝචක ඩයෝඩයකි.

16. අබ ඇට ස්වල්පයක් රබානක් මතුපිටට දමා රබානට සෙමින් තට්ටු කරන විට අබ ඇට ඔබ මොබ චලනය වනු දැකිය හැක. මෙයින් නිගමනය කල හැක්කේ,

(1) අබ ඇට සුළඟට කම්පනය වන බව
(2) ධ්වනිය නිපදවන පටලය කම්පනය වන බව
(3) අබ ඇට කම්පනය වී හඬ නිපදවන බව
(4) අබ ඇට කම්පනය වීම නිසා පටලය ද කම්පනය වේ.

17. යම් වස්තුවක අඩංගු පදාර්ථ ප්‍රමාණය හැඳින්වෙන්නේ,

(1) ස්කන්ධය ලෙස (2) බර ලෙස (3) පරිමාව ලෙස (4) ඝනත්වය ලෙස

18. පහත ශක්ති ප්‍රභව අතරින් වඩාත් පරිසර හිතකාමී ශක්ති ප්‍රභවය වන්නේ,

(1) ජෛව ස්කන්ධ (2) ගල් අඟුරු (3) න්‍යෂ්ටික ශක්තිය (4) ජල විදුලිය

19. ශ්වසනයේ දී පිටවන කාබන්ඩයොක්සයිඩ් වායුව හඳුනා ගන්නා පරීක්ෂාව වන්නේ,

(1) හුණු දියර කිරි පාට වීම. (2) සබන් දියර කිරි පාට වීම
(3) අවර්ණ හුණු දියර කිරි පාට වීම (4) අවර්ණ සබන් දියර කිරි පාට වීම


20. ශක්ති ප්‍රභවවල තිරසාර භාවිතයට නිදසුනක් වන්නේ,

(1) පතුරු පැදි භාවිතය (2) පෞද්ගලික වාහන භාවිතය
(3) බහුබෝපභෝගී වාහන භාවිතය (4) පොදු ප්‍රවාහන සේවා භාවිතය

## 2 කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

(1) වනාන්තරයක වෙසෙන සතුන් අතර පවතින ආහාර සම්බන්ධතාවයක් පහත දක්වා ඇත.




(i) මෙම ආහාර සම්බන්ධතාව කුමන නමකින් හඳුන්වයි ද?
(ii) මෙහි සිටින ශාක භක්ෂකයන් දෙදෙනෙකු නම් කරන්න.
(iii) මෙහි ඇති ශාක නිෂ්පාදකයන් ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද?
(iv) ආහාර දාමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.
(v) මෙහි ඇති පුරුක් හතරකින් යුත් ආහාර දාමයක් ලියන්න.
(vii) මෙම වනාන්තරයේ වෙසෙන මුවන් සංඛ්‍යාව අසීමිතව වැඩි නොවීමට හේතුව කුමක් ද?
(viii) පහත දෙබෙදුම් සුවිය සම්පූර්ණ කරන්න.

සමනලයා / පිළිහුඬුවා / ගැඩවිලා / ගවයා

පාද ඇති (සමනලයා / පිළිහුඬුවා/ ගවයා) | (A) ................................. (ගැඩවිලා)


හොටක් ඇති (පිළිහුඬුවා) | හොටක් නැති (B) (....................../...........................)

(C) .............................. (ගවයා) | වලිගය නැති (D) .............................


(2) (A) අප අවට ඇති සියලු දෑ පදාර්ථ හා ශක්ති ලෙස වර්ග කළ හැක. පදාර්ථය අවකාශයේ ඉඩක් අත්කර ගන්නා අතර ශක්ති අවකාශයේ ඉඩක් අත්කර නොගනී.

(i) පදාර්ථවලට පොදු ලක්ෂණ 2 ක් ලියන්න.
(ii) නිශ්චිත හැඩයක් නොමැති නිශ්චිත පරිමාවක් ඇති පදාර්ථ වර්ගය නම් කරන්න.
(iii) 6 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායම් 2 ක් වායු පදාර්ථයේ හැසිරීම පිළිබඳව සොයා බැලීමට සිදුකල ප්‍රායෝගික ක්‍රියාකාරකම් 2ක් පහත දැක්වේ. එහි නිරීක්ෂණ මත එළඹිය හැකි නිගමනය වෙන වෙනම ලියන්න.

A




B




(B) ජීවයේ පැවැත්ම සඳහා මෙන්ම බොහෝ මිනිස් ක්‍රියාකාරකම් සඳහා ද ජලය අත්‍යවශ්‍ය සාධකයකි.

(i) භෞතික අවස්ථාව අනුව ජලය පවතින ආකාර 3 ලියන්න.

(ii) ඒ එක එකට උදාහරණය බැගින් ලියන්න.

(iii) ජලයේ ලවණතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iv) ලවණතාව අනුව ජලය වර්ග 3 දක්වන්න.




(v) ශිෂ්‍යයෙක් ජලය පවතින අවස්ථා නිරීක්ෂණයට සකස් කළ ඇටවුමක් රූපයේ දැක්වේ.

(a) මද වේලාවකින් මෙහි දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද?

(b) මෙහි දී සිදුවන අවස්ථා විපර්යාසය ලියන්න.

(3) (A) ශක්තිය භාවිත කර කාර්යයක් කළ හැකි බව පෙන්වීමට විද්‍යා ප්‍රදර්ශනයක් සඳහා සකස් කළ ඇටවුමක් රූපයේ දැක්වේ.



(i) මෙහි ජල බඳුන රත් කිරීම සඳහා ශක්තිය ලැබෙන ශක්ති ප්‍රභවය නම් කරන්න.

(ii) එම ශක්ති ප්‍රභවය මගින් පෘථිවියට ලැබෙන ශක්ති ප්‍රධාන ආකාර දෙක නම් කරන්න.

(iii) මෙහි භාජනයේ ඇති ජලය රත්වන විට ඇති වන නිරීක්ෂණ දෙකක් ලියන්න.

(iv) මෙම ඇටවුම ක්‍රියාත්මක කිරීමේ දී ඔබට හඳුනාගත හැකි ජලයේ භෞතික අවස්ථා දෙක සඳහන් කරන්න.

(v) මෙම ඇටවුමෙන් විදුලිය නිපදවීම ආදර්ශනය කිරීමට තල බඹරයට සම්බන්ධ කළයුතු උපාංගය සඳහන් කරන්න.

(B) අපට ආලෝකය සපයන වස්තු ආලෝක ප්‍රභව වේ.

(i) කෘත්‍රිම ආලෝක ප්‍රභව දෙකක් නම් කරන්න.


(ii) ආලෝකය ගමන් කරන ආකාරය අනුව පහත ද්‍රව්‍ය වර්ග කරන්න.
පිරිසිදු ජලය, සවි කඩදාසි, මල් වීදුරු, කාඩ්බෝඩ්, ලී තහඩුව, අවර්ණ පොලිතීන්.

(iii) පෙනීම ලබාදීම හැර ආලෝකයේ ඇති වෙනත් ප්‍රයෝජන 2 ක් ලියන්න.

(iv) වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකාශ තන්තු භාවිතා කරන අවස්ථාවක් ලියන්න.

(4) (A) ප්‍රදර්ශනයකට තබා ඇති මාළු ටැංකියක කෘතිමව සාදන ලද මාලුන් තිදෙනෙකු තන්තු 3 ක් ආධාරයෙන් රඳවා ඇත. ඉන් එක් මාලුවෙක් තුල චුම්බකයක්ද තව මාලුවෙකුගේ ඇලුමිනියම් තහඩුවක් ද, අනෙකාගේ යකඩ තහඩුවක් ද රඳවා ඇත.
ප්‍රබල චුම්බකයක් ටැංකියේ වීදුරුවට පිටතින් ඇල්លූ විට පහත නිරීක්ෂණ ලැබුණි.

| මාළුවා | චුම්බකයේ උත්තර ධ්‍රැවය ලංකල විට | චුම්බකයේ දක්ෂිණ ධ්‍රැවය ලංකලවිට |
|---|---|---|
| A | ආකර්ෂණය | ආකර්ෂණය |
| B | ආකර්ෂණය | විකර්ෂණය |
| C | වෙනසක් නැත | වෙනසක් නැත |



(i) ඇලුමිනියම් තහඩුව ඇති මාළුවා නම් කරන්න.


(ii) යකඩ තහඩුව ඇති මාළුවා නම් කරන්න. 10798


(iii) චුම්බකයක් අඩංගු මාළුවා නම් කරන්න.

(iv) පහත ද්‍රව්‍යවලින් චුම්බක ද්‍රව්‍ය නම් කරන්න.

යකඩ ඇණය / පිත්තල ඇණය/ තඹ කම්බිය / ඇලුමිනියම් කම්බිය / කාසිය / ඇල්පෙනෙත්ත.

(B) පහත දක්වා ඇත්තේ විද්‍යාව පාඩමකට කණ්ඩායම දෙකක් සාදා ඇති ධ්වනිය උපදවන උපකරණ 2 කි.


A


B

(i) A හා B හඳුනාගෙන නම් කරන්න.

(ii) A හා B ධ්වනිය නිපදවන ආකාරය වෙන වෙනම ලියන්න.

(iii) A හා B හි හඬ නිපදවෙන ආකාරයට හඬ නිපදවා ගැනීමට තනා ඇති **වෙනත්** සංගීත භාණ්ඩ 01 බැගින් නම් කරන්න.

(5) (A) සුව පහසු දිවියකට විදුලිය අපට වැදගත්වේ. නමුත් එය ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතු අතර අරපරිස්සම් කිරීම ද අත්‍යවශ්‍ය ය.

(i) විදුලි ශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීමට උචිත ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න.


(ii) එදිනෙදා ජීවිතයේ විදුලි අනතුරු වළක්වා ගත හැකි ආකාරයක් දක්වන්න.

(iii) ශිෂ්‍යයෙකු නිර්මාණය කළ කුඩා විදුලි බලාගාරයක ආකෘතියක් පහත දැක්වේ.

(a) ඉහත උපකරණයේ මෝටරය නොතෙමෙනසේ යෝගට් හැඳි මතට ජලපහරක් ඇල්ලු විට A හි දැකිය හැකි නිරීක්ෂණය කුමක් ද?

(b) පහත සඳහන් කොටස් බලාගාරයේ කුමන උපාංග නියෝජනය කරයි ද?

1.මෝටරය 2. යෝගට් හැඳි සහිත කොටස



A

(B) සරල කෝෂයක ඇටවුමක් පහත රූපයේ දක්වා ඇත. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම කෝෂය ක්‍රියාකිරීමේදී දැකිය හැකි නිරීක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ii) මෙම කෝෂයේ ඇති දුර්වලතා දෙකක් දක්වන්න.

(iii) එම දුර්වලතා මගහරවා ගෙන නිපදවා ඇති කෝෂ වර්ගයක් නම් කරන්න.



(6) (A) කෙටි කාලයක් තුළ නිශ්චිත ස්ථානයක පවතින වායුගෝලය තත්වය කාලගුණය නම් වේ. 6 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් රැස්කල තොරතුරුවලින් කිහිපයක් පහත වගුවේ ඇත.

| දිනය | නගරය | උෂ්ණත්වය | වර්ෂාපතනය | වායුගෝලයේ ඇති ජලවාෂ්ප ප්‍රමාණය |
|---|---|---|---|---|
| 9/01 | ගාල්ල | 27 °C | 15 mm | 75% |
| | බදුල්ල | 30 °C | 0.1 mm | 50% |
| | කොළඹ | 29 °C | 0.8 mm | 75% |
| 9/02 | ගාල්ල | 28 °C | 14 mm | 80% |
| | බදුල්ල | 21 °C | 0.1 mm | 90% |
| | කොළඹ | 26 °C | 1.8 mm | 80% |

(i) දින දෙකේම **වැඩිම** වර්ෂාපතනය ලැබුණු නගරය කුමක් ද?


(ii) මෙම දින දෙක තුල **උපරිම** උෂ්ණත්වය වාර්තා වූ නගරය කුමක් ද?

(iii) කාලගුණික තොරතුරු ඉදිරිපත් කිරීමට මෙහි ඇති තොරතුරුවලට අමතරව යොදා ගත හැකි වෙනත් සාධකයක් ලියන්න.

ඉහත දින දෙක තුල එක් එක් නගරවල ආර්ද්‍රතාවය වෙනස් වූ ආකාරය පහත ප්‍රස්තාරයෙන් දක්වා ඇත.

(iv) ප්‍රස්තාරය ඇසුරෙන් X,Y හා Z වලින් දැක්වෙන නගර නම් කරන්න.

(v) ප්‍රස්තාරය ඇසුරෙන් සමාන ආර්ද්‍රතාවක් ඇති නගර දෙක නම් කරන්න.





(B) දුව ප්‍රසාරණය වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීමට පහත ඇටවුම භාවිත කළ හැකි ය.

(i) පාට කළ ජලය සහිත බෝතලය උෂ්ණත්වය වැඩි ජලයේ ගිල් වූ විට දැකිය හැකි නිරීක්ෂණය සඳහන් කරන්න.

(ii) ඒ ඇසුරෙන් එළැඹිය හැකි නිගමනය කුමක් ද?

(iii) ඉහත ඇටවුම ඇසුරෙන් නිර්මාණය කර ඇති උපකරණය නම් කරන්න.



සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023(2024)
Final Term Test – 2023(2024)

| | |
|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 6 | විද්‍යාව / Science |

පිළිතුරු පත්‍රය

1 කොටස

| | | | |
|---|---|---|---|
| 1). 4 | 6). 3 | 11). 3 | 16). 2 |
| 2). 2 | 7). 2 | 12). 1 | 17). 1 |
| 3). 3 | 8). 3 | 13). 3 | 18). 4 |
| 4). 4 | 9). 1 | 14). 4 | 19). 3 |
| 5). 2 | 10).2 | 15). 3 | 20). 4 |

මුළු ලකුණු 40

2 කොටස

1. (i).ආහාර ජාල — ලකුණු 02
   (ii). මුවා,සමනලයා,තණකොළ පෙත්තා ඕනෑම සතුන් දෙදෙනෙකුට — ලකුණු 02
   (iii).ශාක තමා විසින්ම ආහාර නිපදවා ගන්නා නිසා — ලකුණු 02
   (iv).හරිත ශාකයකින් හෝ ශාක කොටසකින් ආරම්භ වී අනුක්‍රමයෙන් සතුන් ඔස්සේ ආහාර සම්බන්ධතා නිරූපණය කරන රේඛීය සටහනක් — ලකුණු 02
   (v). ශාක → සමනලයා → ගෙම්බා → නයා
   ශාක → තණකොළ පෙත්තා → ගෙම්බා → නයා මින් ඕනෑම එකකට — ලකුණු 02
   (vi). මුවන් දිවියන් මගින් ගොදුරු කර ගන්නා නිසා — ලකුණු 02
   (vii). A-පාද නැති B-සමනලයා,ගවයා C-වලිගය ඇති D-සමනලයා — ලකුණු 04

මුළු ලකුණු 16

2) (A) (i).ස්කන්ධයක් තිබීම,අවකාශයේ ඉඩක් ගැනීම — ලකුණු 02
   (ii).ද්‍රව පදාර්ථය — ලකුණු 01
   (iii). A . වායු පදාර්ථය අවකාශයේ ඉඩක් ගන්නා බව — ලකුණු 01
   B. වායු පදාර්ථයට ස්කන්ධයක් ඇති බව — ලකුණු 01
   (B) (i).ඝන,ද්‍රව,වායු තුනම නිවැරදි නම් — ලකුණු 01
   (ii).ඝන- අයිස්/ග්ලැසියර/හිම
   ද්‍රව- ජලය
   වායු-ජල වාෂ්ප/හුමාලය උදාහරණ 3 ම නිවැරදි නම් — ලකුණු 01
   (iii).ජලයේ දිය වූ ලවණ ප්‍රමාණය — ලකුණු 01
   (iv).කරදිය,මිරිදිය,කිවුල් දිය උදාහරණ 3 ම නිවැරදි නම් — ලකුණු 01
   (v). a). වීදුරුව පිට පැත්තේ ජල බිංදු තැන්පත් වීම — ලකුණු 01
   b).වාතයේ ජල වාෂ්ප ඇති බව — ලකුණු 01

මුළු ලකුණු 11

3) (A) (i).සූර්යයා — ලකුණු 01
   (ii).ආලෝක ශක්තිය, තාප ශක්තිය — ලකුණු 01
   (iii).ජලයේ උෂ්ණත්වය වැඩිවීම, භාජනයෙන් හුමාලය පිටවීම.
   තල බඹරය/රෝදය කැරකැවීම ඕනෑම දෙකකට — ලකුණු 01
   (iv). ද්‍රව.වායු — ලකුණු 01
   (v).ඩයිනමෝවක් — ලකුණු 01

(B) (i).විදුලි බල්බය, ඉටිපන්දම වැනි නිවැරදි පිළිතුරු දෙකකට ලකුණු 01

(ii).පාර දෘශ්‍ය- අවර්ණ පොලිතීන්, පිරිසිදු ජලය
පාරභාසක- සවි කඩදාසි, මල් වීදුරු
පාරාන්ධ- කාඩ්බෝඩ්, ලී තහඩුව වර්ගය හා උදාහරණ දෙකම නිවැරදි නම් ලකුණු 1 බැගින් ලකුණු 03

(iii).ශාක වල ආහාර නිෂ්පාදනයට/ සංඥා ලෙස/ ප්‍රදීපනයට/ සන්නිවේදනයට වෛද්‍ය විද්‍යාවට ඕනෑම දෙකකට ලකුණු 01

(iv).එන්ඩස්කෝප් උපකරණය/ශරීර අභ්‍යන්තරය පරීක්ෂා කිරීමට ලකුණු 01

**මුළු ලකුණු 11**

(4) A.(i). C
(ii).A
(iii).B ලකුණු 03
(iv). යකඩ ඇණය / කාසිය / ඇල්පෙනෙත්ත ලකුණු 03

B. (i). A- බෙරය/ගැට බෙරය B- ගිටාරය ලකුණු 02
(ii). A- පටල කම්පනයෙන් B- තත් කම්පනයෙන් ලකුණු 02
(iii).A- රබාන B- වයලීනය වැනි නිවැරදි පිළිතුරු 2 කට ලකුණු 01

**මුළු ලකුණු 11**

(4) A.(i). කාර්යක්ෂම විදුලි බුබුළු භාවිතය/ විදුලි උපාංග භාවිත නොවන අවස්ථාවල ක්‍රියාත්මක තත්ත්වයේ නොතැබීම/ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහනී ආදියේ හඬ අනවශ්‍ය ලෙස වැඩි කිරීමෙන් වැළකීම/ කාර්යක්ෂම LED හා LCD තිර සහිත පරිගණක හා රූපවාහිනී යන්ත්‍ර භාවිතය/විදුලි ස්ත්‍රික්කය භාවිතයෙන් රෙදි මැදීමේ දී එකවර රෙදි කිහිපයක් මැද ගැනීම වැනි නිවැරදි පිළිතුරු 2 කට (ලකුණු 02)

(ii) විදුලි පරිපථ හා උපකරණ ජලය ඇති තැන්වල දී භාවිත නොකිරීම
විදුලි පරිපථය හා සම්බන්ධ සෑම නඩත්තු කටයුත්තකටම පෙර අදාළ පරිපථයෙහි හෝ මුළුමනින් ම හෝ විදුලි සැපයුම විසන්ධි කිරීම
විදුලි රැහැන් මතට ඇද වැටෙන සේ ගස් කැපීමෙන් වැළකීම.
විදුලි රැහැන් අවට සරුංගල් හෝ සෙල්ලම් අහස් යානා වැනි දේ යැවීමෙන් වැළකීම.
විදුලි රැහැන් ආසන්නයේ 'ඇන්ටෙනා' ආදිය සවි කිරීමෙන් වැළකීම.
වැනි නිවැරදි පිළිතුරු 1 කට (ලකුණු 01)

(iii). a).කටුව චලනය වීම ලකුණු 01
b).1- ඩයිනමෝව 2- තල බඹරය ලකුණු 02

B. (i).බල්බය දැල්වීම, සින්ක් තහඩුව දියවීම,තඹ තහඩුව මත වායු බුබුලු තැන්පත්වීම
වැනි නිවැරදි පිළිතුරු දෙකකට ලකුණු 02
(ii).එහා මෙහා ගෙන යාම අපහසු වීම,වැඩි ධාරාවක් ලබා ගත නොහැකිවීම ලකුණු 02
(iii). වියළි කෝෂය ලකුණු 01

**මුළු ලකුණු 11**

(6).A.(i) ගාල්ල ලකුණු 01
(ii) බදුල්ල ලකුණු 01
(iii) සුළඟේ වේගය / සුළඟේ දිශාව/ වායුගෝලීය පීඩනය ලකුණු 01
(iv).X- ගාල්ල Y- බදුල්ල Z- කොළඹ ලකුණු 03
(v). ගාල්ල හා කොළඹ ලකුණු 02

B. (i). වීදුරු බටය ඔස්සේ පාට කළ ජලය ඉහළ නැගීම ලකුණු 01
(ii). ද්‍රව්‍යකට තාපය සැපයූ විට පරිමාව වැඩිවේ/ප්‍රසාරණය වේ. ලකුණු 01
(iii). රසදිය උෂ්ණත්වමානය/මධ්‍යසාර උෂ්ණත්වමානය ලකුණු 01

**මුළු ලකුණු 11**



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න